
# උසද මිටිද

## ක්‍රියාකාරකම - 01


උස අඩු රූපය පාට කරමු.




උස අඩු රූපය පාට කරමු.



උස වැඩි රූපය පාට කරමු.




උස වැඩි රූපය පාට කරමු.



## එළවළු පලතුරු තෝරමු

ක්‍රියාකාරකම - 02

- එළවළු හා පලතුරු වට්ටිවලට ගැළපෙන සේ ඉරකින් යා කරමු.
- පාට කරමු.



# ගොවිතැන හරි අගෙයි

## ක්‍රියාකාරකම - 03


- දී ඇති පින්තූර දෙස හොඳින් බලමු.

    - ★ පින්තූරයෙන් දැක්වෙන දේ පිළිබඳ දරුවා සමග කතා කරන්න.
    - ★ එක් එක් වැඩ කිරීම සඳහා අවශ්‍ය වන උපකරණවල නම් කියා දෙන්න.

- එක් එක් වැඩයට ගැළපෙන උපකරණය තෝරා යා කරමු.


















# අපි කුස්සියේ උපකරණ හඳුනමු

## ක්‍රියාකාරකම - 04

★ මැටි සොයා දෙන්න.
★ කුස්සියේ ඇති උපකරණ මැටියෙන් සෑදීමට දරුවාට සහයවන්න.
(උදාහරණ:- වංගෙඩිය, මෝල්ගහ, හට්ටිය, මුට්ටිය වැනි දේවල්)

- හඳුනපු උපකරණවල නම් කියමු.
- පහත රූප පාට කරමු.



# රසයි ගුණයි පලතුරු බීම



- පින්තූරය දෙස හොඳින් බලමු.
- පින්තූරයේ තිබෙන දේ විස්තර කරමු.
- ගණන් කරමු.
  - අන්නාසි ගෙඩි කීයද ?
  - අඹ ගෙඩි කීයද ?
  - කොමඩු ගෙඩි කීයද ?
- පලතුරුවල පින්තූර අලවා පොතක් හදමු.



## අපට හරි සතුටුයි

ක්‍රියාකාරකම - 06



- ★ රාත්‍රී නිදහස් වේලාවක් යොදා ගන්න.
- ★ ඉඩ ඇති සුදුසු තැනක පැදුරක් මත නිවසේ සියලු දෙනා ඉඳගන්න.
- ★ දරුවාගේ අතට මයික්‍රෆෝනයක් හෝ එවැනි ආදේශකයක් දෙන්න.
- ★ සැවොම ඉදිරියේ දරුවා කැමති නැටුමක්, කතන්දරයක්, ගීතයක් ඉදිරිපත් කිරීමට කියන්න
- ★ සියලු දෙනාම එකතුවී අත්පොඩි ගසමින් දරුවා දිරිමත් කරන්න.

## දුවමු පනිමු රවුම් අඳිමු

ක්‍රියාකාරකම - 07

- ★ දරුවා සමඟ මිදුලට යන්න.
- ★ එක රවුමක සිට අනෙක් රවුමට දරුවාට පහසුවෙන් පැනීමට හැකිවන ලෙස රවුම් 6ක් අඳින්න. (රූපයේ දක්වා ඇත.)

- රවුම් 6 න් එක රවුමක මැද සිට ගනිමු.
- එම රවුම වටේට තවත් රවුමක් අඳිමු.
- ඊළඟ රවුමට පැන එම රවුම වටේට ද රවුමක් අඳිමු.
- මේ අයුරින් රවුම් 6 ට ම පැන රවුම් වටේට රවුම් අඳිමු.




රවුම් රවුම් අපි අඳිමු
එක් එක් රවුමට පනිමු
රවුම් වටේ රවුම් ඇඳලා
රවුම වටේ අපි දුවමු


# රූප දෙකම එක වගේද ?

## ක්‍රියාකාරකම - 08

- රූප දෙකම හොඳින් බලමු.
- 1 රූපයට අනුව 2 රූපයේ ඇති අඩු කොටස් සොයමු.
- 1 රූපය දෙස බලා 2 රූපයේ අඩු කොටස් අඳිමු.
- රූප දෙකම පාට කරමු. ලස්සනයි ද බලමු.



1 රූපය



2 රූපය

## ඔබ කොහෙද ? ක්‍රියාකාරකම - 09


- පින්තූරය දෙස හොඳින් බලමු. උත්තර කියමු.

- මල් පෝච්චිය තිබෙන්නේ කොහේද ?
- මේසය යට තිබෙන්නේ කුමක්ද ?
- මේසය ළඟ සිටින්නේ කවුද ?
- මේසයට ඈතින් සිටින්නේ කවුද ?




# අපි ගමන් යමු

## ක්‍රියාකාරකම - 10











- දී ඇති රූප දෙස බලමු.
- රූපවල නම් කියමු.
- අහසේ යන වාහනය පෙන්වමු.
- මුහුදේ යන වාහනය පෙන්වමු.
- වාහනවල පින්තූර අලවා පොතක් හදමු.

★ *දරුවා සමග ගීතය ගායනා කරන්න*

හොස් හොස් කියලා - වංගු වංගු හැරිලා
කඳුගැට නැගලා පල්ලම් බැහැලා කෝච්චියක් එනවා


# ට්‍රිලිං ට්‍රිලිං ට්‍රිලිං

## ක්‍රියාකාරකම - 11

- දී ඇති රූප දෙස බලමු.
- රූපවල නම් කියමු.

★ (නොදන්නා රූප කියාදෙන්න)











★ මෙම ගීතය දරුවා සමඟ ගායනා කරන්න

ට්‍රිලිං ට්‍රිලිං ට්‍රිලිං කියල
ලියුම් මාමා ඇවිල්ලා
හනික දුවල ඇවිල්ලා
ලියුම ගන්න බලාලා


★ මුද්දරයක් සොයා දී මෙම ලියුම් කවරයේ කුඩා කොටුව තුළ මුද්දරය ඇලවීමට දෙන්න.




## පුංචි අපි සත්තු වෙමු


ක්‍රියාකාරකම - 12

- සතුන් පාට කරමු.
- මෙම සතුන්ගේ නම් කියමු.
- මෙම සතුන් ගමන් කරන ආකාරය කරලා පෙන්වමු.
- සතුන්ගේ පින්තූර අලවා පොතක් හදමු.










## කවුද මේ ?



- රූපය දෙස බලමු.
- මුහුණේ ඇස් දෙක, නාසය, හා කට අඳිමු.
- අත් හා කකුල් අඳිමු.
- රූපය පාට කරමු.



## පුංචි අපිත් ලොකු වෙනවා

**ක්‍රියාකාරකම - 14**

- පින්තූරයේ ඇති රූප දෙස හොඳින් බලමු.
- එම රූප ගැන කතා කරමු.
- රූපවලින් කුඩාම කාලයේ රූපය පෙන්වමු.
  - *(තම දරුවාගේ කුඩාම කාලයේ පින්තූර තිබේ නම් පෙන්වා එම කාලයේ කරන ලද දෑ පිළිබඳව කතා කරන්න.)*
- දී ඇති රූපවලින් දරුවෙකු වැඩෙන අවස්ථා පිළිවෙලින් පෙන්වමු.
  - *(තම දරුවාගේ ද එම කාලයන් පිළිබඳව කතා කරන්න.)*



## අපිත් වැඩෙනවා ගසුත් වැඩෙනවා

**ක්‍රියාකාරකම - 15**

- බෝංචි, කව්පි, මෑ වැනි ධාන්‍ය වර්ගයක් සොයාගෙන ඉඩ ඇති සුදුසු තැනක හෝ බඳුනක හදමු, වතුර දමමු.
- පැළය වැඩෙන හැටි බලමු.
- පැළය චිත්‍රයට නගමු.



## කුරුලු ගෙදරක් හදමු



- පාට කඩදාසියක් මත යෝගට් කෝප්පයක් තබා රවුම් 03ක් කපා ගනිමු. (1 රූපය බලන්න.)
- එක් එක් රවුම දෙකට නවා ගනිමු.
- පහළ සිට ඉහළට වෙන් නොවන සේ පෙඳය කොටස කපා ගනිමු. (2 රූපය බලන්න.)
- ඇස් හා හොටය අලවමු. (3 රූපය බලන්න.)
- සාදාගත් කුරුල්ලන් පහත ගසේ කැමති තැන්වල අලවමු.



1 2 3



# සතුන්ට අපි ආදරෙයි



ඔන්න දුවේ පුතේ ලස්සන පුංචි ගමක හංසියි , කවිඳුයි කියලා පුංචි ළමයි දෙන්නෙක් හිටියා. හංසිට ලස්සන ගෙවත්තක් තිබුණා. පාට පාට ලස්සන මල්, පලතුරු,එළවළු ගොඩක් තිබුණා. මල් වල පැණි බොන්න, පලතුරු කන්න සමනල්ලු කුරුල්ලෝ මේ වත්තට එනවා. නිවාඩු වෙලාවට හංසියි කවිඳුයි දෙන්නා හංසිගේ ගෙවත්තේ හදල තිබුණු සෙල්ලම් ගෙදර සෙල්ලම් කරනවා.

හුඟාක් කාලයකින් කොහේවත් යන්න බැරිවුණු නිසා හංසියි අම්මයි තාත්තයි හංසිගෙ මාමලාගේ ගෙදර ගියා. එහේ ටික දවසක් ඉඳලා ආපසු ගෙදර ආවා. හංසි ආපු ගමන් වත්ත පැත්තේ ටිකක් ඇවිදල බැලුවා. අනේ හංසිගේ ගෙවත්ත පාළුවට ගිහින්........ හංසිට ගොඩක් දුක හිතුණා. ඉතින් හංසි වත්තට වෙලා දුකින් බලන් ඉන්න කොට හංසිගේ යාළුවා කවිඳු එතැනට ආවා. "හංසි ඇයි ඔයා දුකින් වගේ ඉන්නේ?" කවිඳු ඇහුවා. "කවිඳු, බලන්නකො අපි මාමලාගේ ගෙදර ගිහින් ආපසු ඇවිත් බලන කොට ලස්සනට තිබුණු වත්ත පාළු වෙලා ගිහින්. ගස් වැල් වේළිලා ගිහින්. සමනල්ලු එන්නෙත් නෑ. කුරුල්ලො එන්නෙත් නෑ. " හංසි එයාගේ කතාව දුකෙන් කවිඳුට කිව්වා. කවිඳුටත් හරියට දුක හිතුණා. කවිඳු කල්පනා කළා. කවිඳු හංසිට මෙහෙම කිව්වා. "අපි දෙන්නා එකතුවෙලා ගෙවත්තේ මල් පැළවලටයි ගස්වැල්වලටයි හැමදාම වතුර දාමු"

ඔන්න ඉතිං යාළුවෝ දෙන්නාම පැළවලට හැමදාම වතුර දැම්මා. මෙන්න ටික දවසක් යනකොට ගස්වැල් මල් හිනා වෙන්න පටන්ගත්තා. මල් පිපිලා, පලතුරු ඉදිලා, පළාතම හරිම සුවඳයි. සුවඳ දිගේ සමනල්ලු, කුරුල්ලෝ එක්කෙනා දෙන්නා එන්න පටන්ගත්තා. දැන් දෙන්නට හරිම සතුටුයි. හංසිට තවත් අදහසක් ආවා. "කවිඳු, වත්තට එන සතුන්ට කෑම දාන්න කෑම ලෑල්ලකුත් හදමු නේද? එතකොට තවත් සමනල්ලු, කුරුල්ලෝ එයි." හංසි කිව්වා. දෙන්නා එක්ක එකතු වෙලා කෑම ලෑල්ලකුත් හදලා වත්ත පහළ කොස් ගහ යට ලෑල්ල සවි කළා.

"ඉන්න මම ගෙට ගිහින් කෑම ටිකක් ගේන්නම්" හංසි ගෙට දුවලා ගිහින් කෑම ගෙනාවා. කවිඳු ලෑල්ලට කෑම දැම්මා. හංසියි , කවිඳුයි ගහකට මුවාවෙලා ටික වෙලාවක් බලා සිටියා. ලේන් පැටවු, කුරුල්ලෝ කෑම දැකලා කෑම ලෑල්ලට ආවා. උන් කෑම කන හැටි දැකලා දෙන්නට හරිම සතුටුයි.

ඉතිං දුවේ,පුතේ හංසියි කවිඳුයි වගේ අපිත් සතුන්ටත් පරිසරයටත් ආදරය කරමු.



- ★ මෙම කතන්දරය දරුවාට කියා දෙන්න.
- ★ දරුවා සමඟ සතුන්ට කෑම ලෑල්ලක් සාදා සුදුසු තැනක තබන්න.
- ★ දිනපතා සතුන්ට කෑම දැමීමට දරුවාට උදව් කරන්න.

## මගේ අතේ හැඩ

### ක්‍රියාකාරකම - 18

- නිල් කුඩු හෝ දිය සායම් සොයා ගනිමු.
- එය පිගානක දිය කර ගනිමු. (දරුවාගේ අත්ලේ පාට තැවරෙන පරිදි)
- දිය කර ගත් සායම් මත අත්ල තබමු.
- සායම් තැවරුණු අත්ල පහත හිස් කොටුව තුළ තබමු.
- මෙලෙස කොටුව පිරෙන සේ අත්ල කිහිපවරක් තබමු. ලස්සන බලමු.

# පින්තූර අලවමු

## ක්‍රියාකාරකම - 19

★ දී ඇති පින්තූර කොලයේ ඇති රූප කපා ගැලපෙන තැන්වල අලවමු.

- පින්තූරයේ තිබෙන දේ විස්තර කරමු.
- සතුන්ගේ නම් කියමු.
- කුකුළු පැටව් කී දෙනාද ?
- වළාකුළු මොන පාටද ?



# කොටස් අලවා රූපය සම්පූර්ණ කරමු

## ක්‍රියාකාරකම - 20



- ★ දී ඇති පින්තූර කොලයේ ඇති රූප කොටස් කපා ගනිමු.
- ★ දී ඇති ඉබ්බාගේ පින්තූරය බලා ගැලපෙන සේ අලවමු.

# පින්තූර කොලය



